# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2277/40 – 2022 අප්‍රේල් 27 වැනි බදාදා – 2022.04.27

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/01/2019/61.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2021.02.05 දිනැති හා අංක 2213/48 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2021.01.04 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් රත්මලාන, චක්කින්දාරාම පාර, අංක 72/6 හි පදිංචි චමින්ද දර්ශක තිලකරත්න මයා සහ මල්වාන, වල්ගම, බියගම අපනයන සැකසුම් කලාපයේ, බ්ලොක් ඒ, ලොට් 15 හි පිහිටි ලුමියර් ටෙක්ස්ටයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2022.02.28 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2022 අප්‍රේල් මස 08 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

මගේ අංකය: IR/COM/01/2019/61.

**කොළඹ කාර්මික අධිකරණයේ දී ය.**

A /04/2021

චමින්ද දර්ශක තිලකරත්න මහතා
අංක. 72/6,
චක්කින්දාරාම පාර,
රත්මලාන (1 පාර්ශවකරු/පැමිණිලිකරු)

එදිරිව

ලුමියර් ටෙක්ස්ටයිල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලොට් 15, බ්ලොක් "ඒ",
බියගම අපනයන සැකසුම් කලාපය,
වල්ගම,
මල්වාන (11 වන පාර්ශවය/වගඋත්තරකරු)

**බේරුම්කරණ ප්‍රදානය**

කම්කරු අමාත්‍ය නිමල් සිරිපාලද සිල්වා මහතා විසින් වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන / පනත සමග කියවෙන) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල අනුව, ඉහත දෙපාර්ශවයන් අතර පැන නැගී ඇති ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් මත්තේගොඩ, කුඩමාඩුව "ද විලේජ්" හි 202/B/61 පදිංචි නීතිඥ විජේසූරිය ආරච්චිගේ ජයවික්‍රම වන මා, 2021 ජනවාරි 04 වන දින පත් කරනු ලැබීය.

ඒ අනුව කම්කරු කොමසාරිස් ජනරාල් බී. කේ. ප්‍රභාත් චන්ද්‍රකීර්ති මහතාගේ අංක IR/COM/01/2019/61 හා 2020 දෙසැම්බර් 31 දිනැති ලේඛනය මගින් ඉහත දෙපාර්ශවය අතර කාර්මික ආරවුලට හේතු වී ඇති කරුණ වශයෙන් "ලුමියර් ටෙක්ස්ටයිල්ස් ලිමිටඩ් ( පසුව නම ලුමියර් ටෙක්ස්ටයිලස් ප්‍රයිවට් ලිමිටඩ්) ආයතනයේ" සේවය කළ චමින්ද දර්ශක තිලකරත්න මහතා 2016.07.12 සිට 2016.12.08 දක්වා වැඩ තහනම් කර සිටි කාලයට අදල වැටුප් හා 2011.05.01 සිට 2016.12.08 දක්වා වාහන දීමනා, ඉන්ධන දීමනා, රියදුරු දීමනා ලබා නොදීමෙන් අසාධාරණයක් සිදු වී තිබේද? යන්න හා එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම් ඔහුට හිමි විය යුතු සහන මොනවාද? විසඳීම බේරුම්කරු වශයෙන් මා වෙත යොමු කර ඇත.

ඒ අනුව පැමිණිලිකරු (1 වන පාර්ශවකාර) දර්ශක තිලකරත්න මහතාගේ 2021.02.08 දිනැති ලිපිය මගින් හිඟ වැටුප් රු. 1,098,811/- ක් හා හිඟ දීමනා (වාහන දීමනා හා රියදුරු දීමනා) රු. 3,720,000/- වගඋත්තරකාර සමාගමෙන් අය විය යුතු බව කියා සිටී.

දෙවන පාර්ශවකාර - වගඋත්තරකාර සමාගම සිය කළමනාකරණ (බලයලත් නියෝජිත) එම්. ඒ. සී. ට්‍රවින් පෙරේරා මහතාගේ පිළිතුරු ලිපියෙන් එම ගෙවීම හිඟ හිටි බව පිළිගනී. ඒ අනුව බේරුම්කරු වශයෙන් මම දෙපාර්ශවය හා ඔවුන්ගේ නීතිඥ මහත්ම මහත්මීන් කැඳවා බේරුම්කරණ ක්‍රියාවලියට අවතීර්ණ වීමි.

කම්කරු දෙපාර්තමේන්තුවේ කාර්මික අධිකරණයේ දී බේරුම්කරු විසින් 2021.04.01, 2022.01.16, 2022.02.17 යන දිනවලදී දෙපාර්ශවය සමඟ සාකච්ඡා කොට අවසන් බේරුම්කරණ ප්‍රදනය 2022.02.17 දින ලබා දෙන්නට විය.

මෙහිදී පළවෙනි පාර්ශවය කම්කරු කොමසාරිස් ජනරාල් ඉදිරිපත් කළ යොමුවේ සඳහන් දින සංශෝධනයක් කරන ලදී. ඒ අනුව "2011.05.01 සිට 2016.12.08 දක්වා වාහන දීමනා, ඉන්ධන දීමනා හා රියදුරු දීමනා" යන්න 2011.05.01 සිට 2016.07.12 දින දක්වා වශයෙන් සංශෝධනය විය යුතු බව පැමිණිලිකරු ප්‍රකාශ කෙරුණි.

ඒ අනුව, පළමුවැනි පාර්ශවයේ ඉල්ලීම වනුයේ,

01) 2016.07.12 සිට 2016.12.08 දක්වා වැඩ තහනම්ව සිටි කාලයට අදළ හිඟ වැටුප වන රු. 1,098,811.00 මුදල ලබාගැනීම.
02) 2011.05.01 සිට 2016.07.12 දින දක්වා නොගෙවූ වාහන දීමනා, ඉන්ධන දීමනා හා රියදුරු දීමනාවල එකතුව වන රු. 3,720,000.00 ක මුදල ලබා ගැනීමයි.

වගඋත්තරකාර දෙවන පාර්ශවයේ ඉල්ලීම මත පැමිණිලිකරුට ලැබිය යුතු වාහන දීමනා, ඉන්ධන දීමනා හා රියදුරු දීමනා මුදල වන රු. 3,720,000.00 මුදලින් රු. 220,000.00 කපා හැරීමට පැමිණිලිකරු එකඟ විය. ඒ අනුව පැමිණිලිකරුට අය විය යුතු මුදල රු. 3,500,000.00 කි.

**පිළිගැනීම්**

(1) පළමුවැනි පාර්ශවය ඉල්ලා සිටින 2016.07.02 සිට 2016.12.08 දක්වා වැඩ තහනම්ව සිටි කාලයට හිඟ වැටුප් වශයෙන් රු. 1,098,811.00 ගෙවීමට ඇති බව දෙවන පාර්ශවය/වගඋත්තරකරු පිළිගනී.

(2) පළමුවන පාර්ශවය ඉල්ලා සිටින 2011.05.01 සිට 2016.07.02 දින දක්වා වාහන දීමනාව, ඉන්ධන දීමනා හා රියදුරු දීමනාව වශයෙන් එකතුව රු. 3,500,000.00 ගෙවීමට ඇති බව දෙවන පාර්ශවය වන උත්තරකරු පිළිගනී.

**විසඳිය යුතු කරුණු**

දෙපාර්ශවයේ ලිඛිත සැලකීම් හා වාචික ඉදිරිපත් කිරීම්/ පැහැදිලි කිරීම්/ එකඟතාවයන් අනුව විසඳිය යුතු කරුණු වනුයේ,

(1) හිඟ හිටි ගෙවීම්වල මාසික වාරිකය.
(2) ගෙවීම් ආරම්භ කළ යුතු දිනය.
(3) ගෙවීම් අවසන් කළ යුතු දිනය.

දෙපාර්ශවය හා දීර්ඝ සාකච්ඡාවකින් පසුව දෙපාර්ශවයේ එකඟතාවය මත පහත පරිදි විසඳිය යුතු කරුණුවලට පිළිතුරු ලබා දුනි.

(1) ගෙවිය යුතු හිඟ වැටුප්
හිඟ හිටි වැටුප - රු. 1,098,811.00
මාසික වාරිකය - 2022 ජුනි 25 සිට සෑම මසකම 25 දිනට හෝ ඊට පෙර වාරික 14ක්, මසකට රු. 75,000.00 බැගින් ගෙවීමටද, 15 වන වාරිකය හෙවත් අවසන් වාරිකය රු. 48,811.00 වශයෙන් ගෙවීමට.
ගෙවීම ආරම්භවන දිනය -2022 ජුනි 25, ගෙවා අවසන් කල යුතු දිනය - 2023 අගෝස්තු 25
ගෙවීම් කළයුතු ස්ථානය - මාසික වාරිකය නියමිත දින හෝ ඊට පෙර මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කළ යුතුය.

(2) ගෙවිය යුතු දීමනා (වාහන දීමනා, ඉන්ධන දීමනා, රියදුරු දීමනා) - රු. 3,500,000.00 2023 මාර්තු සිට වාරික 27 ක් හෙවත් 2025 මැයි 10 දක්වා මසකට රු. 120,000.00 බැගින් ද අවසන් වාරිකය (28 වන වාරිකය) වශයෙන් රු. 260,000.00 ක් 2025 ජුනි මස 10 දින හෝ ඊට පෙර ගෙවීම.

ගෙවීම ආරම්භවන දිනය - 2023 මාර්තු 10
ගෙවා අවසන් කළ යුතු දිනය - 2025 ජුනි 10
ගෙවීම් කළ යුතු ස්ථානය - මාසික වාරිකය නියමිත දින හෝ ඊට පෙර මැද කොළඹ දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ තැන්පත් කළ යුතුය.

**විශේෂ සටහන**

වර්ෂ 2020 සිට මේ දක්වා රට තුළ පැතිරී යමින් පවතින කොවිඩ් වසංගත තත්වය හේතුවෙන් රට තුළ උද්ගත වී ඇති ආර්ථික දුෂ්කරතා හේතුවෙන් හා විශේෂයෙන් වර්තමානයේ අත් විඳින විනිමය දුෂ්කරතා ව්‍යාපාරිකයින්/ කර්මාන්ත හිමියන් මුහුණ දී ඇති ආර්ථික ගැටලු පිළිබඳ සලකා ව්‍යාපාර ක්ෂේත්‍රය අඛණ්ඩව පවත්වාගෙන යමින් සිය නෛතික වගකීම් ඉටු කිරීමට අවස්ථාව සලසා දීමට දෙපාර්ශවය එකඟතාවයට පැමිණීම හේතුවෙන් ගෙවීම් දින වශයෙන් ඉදිරි දිනයන් යොදා ගත් බව ප්‍රකාශ කරමි.

ඉහත සඳහන් දෙපාර්ශවය බේරුම්කරු ඉදිරියේ එකඟතාවය සාධාරණ හා යුක්ති සහගත බව තීරණය කරමි.

2022 පෙබරවාරි මස 28 වැනි දින,

නීතිඥ ඩබ්. ඒ. ජයවික්‍රම,
බේරුම්කරු.

EOG . 4-0201

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.